**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය :-** : පෙරදිග සංගීතය **අදාළ සතිය :-** ජනවාරි 4 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-.2.1 ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ භාවිතය

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

1* **කියවීම් පත්‍රිකාවේ ඇති සටහන පිටපත් කර ගන්න.**
2* **දී ඇති ඉගෙනුම් ආධාරක මඟින් වන්නම ශ්‍රවනය කරන්න.**
3* **ස්වර පුවරු වාදන ඇතුලත් DVD පටයක් නරඹන්න.**
4* **ස්වර පුවරු වාදනයන්ගේ ස්වභාවය අභ්‍යාස කළ යුතු පිළිවෙළ අධ්‍යයනය කරන්න.**
5* **C Major Scale සමග Chords වාදන ක්‍රියාකාරකමෙහි යෙදෙන්න**
6* **Chords සහිත ගීත ප්‍රස්තාර වාදනය කිරිමට හුරුවන්න.**
7* **තාලානුකූල බව කෙරෙහි අවධානය යොමු කරන්න.**
8* **Chords මාරු කරමින් වාදනය නිරීමට පුහුණු වන්න.**
9* **පාසල් ගීතය හා ජාතික ගීය දිනපතා පුහුණුවීම් කරන්න.**

**කියවීමේ පත්‍රිකාව**

Chords යනුවෙන් ව්‍යවහාරයේ භාවිත වන සංකල්පය බටහිර සංගීත සංකල්පයක් වුව ද ශ්‍රී ලාංකේය ව්‍යාවහාරික සංගීතයේ විශේෂයෙන් භාවිත වන සංකල්පයකි. Chords යනු ස්වර තුනකට වැඩි එකතුවකි. ස්වර තුනක එකතුවකට Triads යනුවෙන් ද භාවිත වේ. ගීතයක දී නම් Melody නමින් හැඳින්වෙන ප්‍රධාන තනුවට ගැළපෙන ලෙස ගීතයේ තාලය මතු වන අයුරින් කෝඩ්ස් වාදනයක් යොදා ගනු ලැබේ. පියානෝවක් වාදනයේ දී දකුණතින් Melody කොටසත්, වමතින් Chords වාදනයත් කරනු ලැබේ. විද්‍යුත් ස්වර පුවරුවක දී ද එසේ වයනු ලැබේ. ඒවාට අදාළ නාමය එහි Display පුවරුවේ දර්ශනය වේ. සාමාන්‍ය වාදක මණ්ඩලයක දී Chords වාදනය ගිටාරයකින් කරනු ලැබේ. එකෝඩියන් නම් සංගීත භාණ්ඩය වාදනයේ දී ද දකුණතින් Melody කොටසත්, වමතින් සුදු පැහැති බොත්තම් ඔබමින් Chords වාදනයත් කළ හැකි ය. Chords වාදනය මඟින් ගීතයට වැඩි අලංකාරයක් සහ රසයක් එකතු වේ.

Major, සහ Minor වශයෙන් ප්‍රධාන Chords වර්ග දෙකකි. මීට අමතර ව එක් ස්වරයකින් තවත් Chords ගණනාවක් බිහි වේ. ඒවා Diminish, Augmented, Seventh, Sustain, Added 6th , Added 9th ආදි වශයෙන් නම් කරනු ඇත. මෙම ශ්‍රේණියේ දී Major, සහ Minor යන කෝඩ්ස් වර්ග දෙක ගැන පමණක් අධ්‍යයනය කිරීම නිර්දේශ කර ඇත.

බටහිර සංගීතයේ දී එක් ස්කේලයක් සඳහා ප්‍රධාන Chords තුනක් පමණක් භාවිත වේ. නිදර්ශනයක් ගෙන බලමු. '' ඕළු නෙළුම් නෙරිය රඟාලා' යන සරල ගීතයේ ඇතුළත් වන ස්වර සියල්ල ශුද්ධ ස්වරය. එම ගීතය Major Scale එකට අයත්ය. ඒ අනුව ශුද්ධ ස්වර ඇතුළත් Chords තුනක් එම ගීතයට ප්‍රමාණවත් ලෙස යොදා ගත හැකි ය. ගීතය සඳහා කුමන Chords යොදා ගත යුතු ද, යන්න තීරණය වන්නේ එම ගීතය අයත් වන Scale එක අනුව ය. ''ඕළු නෙළුම් නෙරිය රඟාලා' යන සරල ගීතයේ ආරම්භක ස්වර පාද දෙක මෙසේ ය.

ස-ස රිරි- / ග-ග මධ- / ප-- --- /

පපප මමම / පප- මම- / ග-- --- /

මෙම ස්වර ප්‍රස්තාරය ' C ' Major Scale එකට අයත් ය. ශ්‍රැති කරගෙන ඇත්තේ ' ස 'ස්වරය යි. ''ඕළු නෙළුම් නෙරිය රඟාලා'' යන සරල ගීතය ' රි ' ස්වරය ශ්‍රැති කර ගතහොත් ස්වර පාද දෙක මෙසේ ය.

රි-රි ගග- / ම්ම්- පනි- / ධ-- --- /

ධධධ පපප / ධධ- පප- / ම්-- --- /


මෙම ස්වර ප්‍රස්තාරය ' D ' Major Scale එකට අයත් ය. ශ්‍රැති කරගෙන ඇත්තේ ' රි ' ස්වරය යි. ඒ අනුව එක ම ගීතය වුවත් එක් එක් Scale එක අනුව යොදා ගැනෙන Chords වෙනස් වේ. ඒ අනුව 'C ' Major ස්කේලයට අයත් ලෙස එම ගීතය වාදනය කෙරේ නම් ඒ සඳහා යොදා ගත හැකි Chords තුන වන්නේ 'C Major' 'G Major' 'F Major' යන Chords තුන ය. කිසියම් අවස්ථාවක 'D Major' Scale එකට අයත් ලෙස එම ගීතය වාදනය කෙරේ නම් ඒ සඳහා යොදා ගත හැකි Chords තුන වන්නේ 'D Major' 'A Major' 'G Major' යන Chords තුන ය. මෙසේ වුවත් නූතන නිර්මාණ සංගීතයේ දී එක් Scale එකකට අයත් ගීතයකට Chords ගණනාවක් යොදා ගන්නා අවස්ථා ඇත. මූලික ව Chords ගැන අධ්‍යයනයක් කරන නිසා එක් එක් Scale එකකට අයත් ප්‍රධාන Chords තුන පහත දැක්වෙන සටහනින් අධ්‍යයනය කරමු. ඉහළ සිට පහළට එන පිළිවෙළ ගැන සිතමින් එම වගුවේ හිස්තැන් පුරවන්න

| Scale | Chords |
|---|---|
| C Major | C Major F Major G Major |
| D Major | D Major G Major A Major |
| E Major | E Major ............................ |
| F Major | F Major ............................ |
| G Major | G Major ............................ |
| A Major | A Major ............................ |
| B Major | B Major ............................ |

Minor Scale එකකට ද ඉහත ආකාරයට සමාන ව Minor Chords අයත් වේ. ඒ මෙසේ ය. C Minor Scale එකට C-Minor, F-Minor, G-Minor වශයෙන් ප්‍රධාන Chords තුන අයත් වේ.

මීළඟට මේ එක් එක් Chord එකකට අයත් ස්වර මොනවා දූ යි හඳුනා ගනිමු.

පහත දැක්වෙන ස්වර පුවරුව අධ්‍යයනය කරන්න. එහි සප්තකයේ ස්වර 12ට, 1 සිට 12 තෙක් අංක යොදා ඇත. ඒවා අර්ධ ස්වර 12ක් නැතහොත් Semitone 12ක් වශයෙන් ද හැඳින්විය හැකිය. මෙම පාඩමේ දී එතරම් අවශ්‍ය නොවුණත් සම්පූර්ණ ස්වරයක (Tone) හඬක් වීමට අර්ධ ස්වර (Semitone) දෙකක් තිබිය යුතු ය, යන කාරණය මතකයේ රඳවා ගන්න. ස ස්වරයේ සිට රි ස්වරයට දුර ටෝන් (Tone) එකකි. නැතහොත් Semitone 2කි. අර්ධ ස්වර දෙකකි. ඒ අනුව සප්තකයක් තුළ අර්ධ ස්වර 12ක් නැතහොත් Semitone 12ක් ඇත.



ඒ අනුව " සරිරිගගමම/පධධනිනි " යන ස්වර 12 අංක 1 සිට 12 තෙක් අංකනය කර ගැනීමෙන් පහසුවෙන් මෙය අධ්‍යයනය කළ හැකි ය. ඒ අනුව Chord එකකට නියමිත ස්වර 3 සොයා ගත හැකි ක්‍රමවේදයක් හඳුනා ගනිමු.

Major Chord එකකට අයත් ස්වර වනුයේ අංක 1+5+8 යන අර්ධ ස්වර ය. කිසියම් ස්වරයක් අංක 1 ලෙස ගෙන එතැන් සිට අංක 5 සහ අංක 8 හිමි වන ස්වර තුන එකතු වූ විට Major Chord එකක් සෑදේ.

Minor Chord එකකට අයත් ස්වර වනුයේ අංක 1+4+8 යන අර්ධ ස්වර ය. කිසියම් ස්වරයක් අංක 1 ලෙස ගෙන එතැන් සිට අංක 4 සහ අංක 8 හිමි වන ස්වර තුන එකතු වූ විට Minor Chord එකක් සෑදේ.

| | Minor Chords ( 1+4+8+) | | | | |
|---|---|---|---|---|---|
| | ආරම්භක ස්වරය | $1^{st}$ Note | නම් කිරීම | ආරම්භක ස්වරය 1 ලෙස ගත් කල 1, 5, 8, අංකවලට හිමි ස්වර (පෙරදිග නමින් | අපරදිග නමින් |
| 1 | ස | C | C Minor | ස + ග + ප | $C+E^{b}+G$ |
| 2 | රි | D | D Minor | රි + ම + ධ | D+ F+A |
| 3 | ග | E | | | |
| 4 | ම | F | | | |
| 5 | ප | G | | | |
| 6 | ධ | A | | | |
| 7 | නි | B | | | |
| 8 | රි | $C^{\#}$ | | | |
| 9 | ග | $E^{b}$ | | | |
| 10 | ධ | $G^{\#}$ | | | |
| 11 | නි | $B^{b}$ | | | |
| 12 | ම/ | $F^{\#}$ | | | |

පහත වගුවේ හිස් තැන්වලට නියමිත Chord නාමයන් සහ අදාළ ස්වර ලකුණු කරන්න. Major Chord එකකට අයත් ස්වර ස්වර්පිනාවක හෝ විද්‍යුත් ස්වර පුවරුවක හෝ වාදනය කර බලන්න.

| | Major Chords ( 1+5+8+) | | | | |
|---|---|---|---|---|---|
| | | $1^{st}$ Note | නම් කිරීම | ආරම්භක ස්වරය 1 ලෙස ගත් කල 1, 5, 8, අංකවලට හිමි ස්වර (පෙරදිග නමින්) | අපරදිග නමින් |
| 1 | | C | C Major | ස + ග + ප | C+E+G |
| 2 | | D | D Major | රි + ම/ + ධ | $D+F^{\#}+A$ |
| 3 | | E | | | |
| 4 | | F | | | |
| 5 | | G | | | |
| 6 | | A | | | |
| 7 | | B | | | |
| 8 | | $C^{\#}$ | | | |
| 9 | | $E^{b}$ | | | |
| 10 | | $G^{\#}$ | | | |
| 11 | | $B^{b}$ | | | |
| 12 | | $F^{\#}$ | | | |

පහත වගුවේ හිස් තැන්වලට නියමිත කෝඩ් නාමයන් සහ අදාළ ස්වර ලකුණු කරන්න.

එක් එක් මයිනර් කෝඩ් එකට අයත් ස්වර ස්වර්පිනාවක හෝ විද්‍යුත් ස්වර පුවරුවක හෝ වාදනය කර බලන්න.

මීළඟට ගීතයකට සුදුසු ලෙස Chord යොදා ගන්නා ආකාරය සරල ව විමසා බලමු. ශුද්ධ ස්වර හත ම යෙදෙන ගීතයක් නිදසුනට ගනිමු. අදාළ ගීතයේ රිද්මය මත Chords වාදනය කරනු ලැබේ. ගීතයේ ස්වර ප්‍රස්තාරය අනුව එක් විභාගයක් තුළ ඇති ස්වර වැඩි ගණනකට ගැළපෙන Chord එක එම විභාගයට යොදනු ලැබේ. සමහර විට එක් විභාගයක Chords දෙකක් ද වාදනය විය හැකි ය. C Major Scale අයත් ගීතයක යම් විභාගයක වැඩි වශයෙන්

සගප - ස්වර ඇත්නම් - " C " Major Chord එකද

මධස - ස්වර ඇත්නම් - " F " Major Chord

පනිරි - ස්වර ඇත්නම් - " G " Major Chord එක ද යොදා ගත හැකි ය.

පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය විමසන්න.

```
C    F        C  G     C            C
ප ප ම ම / ග ග රි රි / ස රි ග ම / ප - - - /

G   F      C           G     F      C
ප - ම -  / ග ම ප ධ / නි නි ධ ධ / ප - - - /
C    G       F    G      C            C   G

ස̇ ස̇ නි නි / ධ ධ ප ප / ප ධ ප ම / ග - රි - /
C            C   G     C
ප ධ ප ම / ග - රි - / ස - - - / - - - - /
```

" C " Minor ස්කේලයට අයත් ගීතයක දී වුව ද ඉහත ක්‍රමය පිළිපදිමින් Minor Chords යොදා ගත යුතු වේ.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය
- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත
- **You tube - https://www.youtube.com/watch?v=LDcYb3pcvvI https://www.youtube.com/watch?v=iGLxuZNvekY**

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- Chords සමග ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි
- ප්‍රාසංගිකව ගීත වාදනය කරයි.
- පෞද්ගලික ජීවිතය රසවත් කර ගැනීමට හැකියාවක් ලබයි
- පාසලේ සියලු උත්සවයන් හි කැපී පෙනෙන සිසුවකු බවට පත්වෙයි.
- වෘත්තීය වාදකයෙකුට අවශ්‍ය මූලික අඩිතාලම ළඟා කර ගනියි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය